

# පුංචි ලේන පැටියා

1.Chandrasekara,Sandeni Denuwandiපුංචිලේන්පැටියා( E-Copy )ISBN 978-624-206-733-99 786242 067339

සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර

# පුංචි ලේන පැටියා

සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර

# **පුංචි ලේන පැටියා**

කර්තෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2023 නොවැම්බර්

කතාව සහ චිත්‍ර

**සඳේනි දෙනුවන්දි චන්ද්‍රසේකර**

1 - ශ්‍රේණිය B

මහ/මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-733-9

Bar Code 9 786242 067339

## <u>පිදුම</u>

මාගේ ආදරණීය

අම්මාටත්, අප්පච්චීටත්,

විදුහල්පතිතුමිය,

පන්ති භාර ගුරුතුමිය ඇතුලු

මාගේ පාසලේ

සියලුම ගුරු මහත්ම මහත්මීන්ටත්,

ආදරණීය සොයුරියන්ටත්

මෙම කෘතිය හද බැතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20



එදා හරිම ලස්සන දවසක්.
ඉර පායලා මල් ගොඩාක්
පිපිලා තිබුණා.



මම ගෙවත්තට ගිහින් අඹ ගසේ තියෙන කෑම ලෑල්ලට බත් ටිකක් දැම්මා.



ටික වේලාවකින් ලේන
අම්මෙක් පුංචි පැටව්
දෙන්නෙක් එක්ක
අඹ ගස දිගේ ආවා.

හෙමින් හෙමින් ලෑල්ලට
ඇවිත් බත් ටික ටික
කෑවා.





එක පාරටම කොහේදෝ
ඉඳන් කලු බළලෙක්
ආවා.



කලු බළලා කෑම
ලෑල්ලට පැන්නා.



අනේ ලේන අම්මයි පැටව්
දෙන්නයි හොඳටම බය
වුණා.

එක පැටියෙක් කෑම
ලෑල්ලෙන් බිමට වැටුණා.



මම කලු බළලාට කෑ
ගැසුවා. කලු බළලා පැනලා
දිව්වා





මම බිම වැටුන ලේන පැටියව අතට ගත්තා. එයාට වතුර ටිකකුත් පෙව්වා.



ලේන අම්මා අඹ ගසේ
ඉඳන් කෑගැසුවා.
ටිං ටිං ටිං



මම ලේන පැටියව කෑම
ලෑල්ලෙන් තිබ්බා. ලේන අම්මාට
හරිම සතුටුයි.




ලේන අම්මයි පැටව්
දෙන්නයි හරිම සතුටෙන්
අඹ ගස මුදුනට ගියා.



මටත් හරිම සතුටුයි. මම
ලේන පැටියාගේ ජීවිතය
බේරා ගත්තා.

ඔයා හරිම හොඳ
දරුවෙක්. අම්මයි,
අප්පච්චියි මගේ
හිස අතගෑවා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20